සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

# චිත්‍ර කලාව - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 1 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් පින්තූරය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01 මෙම රූපයෙන් දැක්වෙන මූර්තිය ............................................................ ශිල්පියාගේ අති විශිෂ්ට නිර්මාණයකි.

02 මෙය ............................................................................................ මාධ්‍යයෙන් නිර්මාණය කරන ලද්දකි.

03 මෙම මූර්තියෙන් ............................................................................ කලා භාවිතය දැකිය නොහැක.

04 මෙම නිර්මාණයෙහි දැකිය හැක්කේ .................................................................. කලා ආභාෂයන් ය.

05 සිදුහත් බෝ සතුන්ගේ ......................................................................... මෙම මූර්තියෙන් පිළිබිඹු කෙරේ.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

06 මුස්ලිම් භක්තිකයන්ගේ ආගමික ස්ථානවල උල් තුඩකින් යුතුව දෙපස ඉදිකර ඇති කුලුණු විශේෂය හඳුන්වන නම කුමක්ද? ..........................................................................................................

07 වියලි බදාමය මත බන්ධන මාධ්‍යයක් සමඟ මිශ්‍ර කර ගන්නා ලද වර්ණ වලින් ඇඳීමේ ක්‍රමය හඳුන්වන්නේ කිනම් නමකින්ද? ...............................................................................................................

08 සීගිරි කාන්තාවන්ගේ ඉණෙන් පහළ වළාකුළු වලින් වැසී ඇති නිසාත් අතින් මල් දරා සිටින නිසාත් "අප්සරාවන්" බවට මතය ප්‍රකාශ කළේ කවුරුන්ද?.........................................................................

09 ජෝර්ජ් කීට් ශිල්පියාගේ නායිකා චිත්‍ර සඳහා ඔහු භාවිතා කර ඇති වර්ණ මාධ්‍ය කුමක්ද?

..........................................................................................................................................

10 "කුඹල්හල" නමැති සිතුවම නිර්මාණය කළ නූතනවාදී චිත්‍ර ශිල්පියා කවුද?

..........................................................................................................................................

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 මුරගල කැටයම ලක්දිව කලා නිර්මාණ අතර අගනා කලා කෘතියක් ලෙස සැලකෙන්නේ,

(1) කළුගල් භාවිතයෙන් අධි උන්නතව නිර්මාණය කර ඇති නිසා ය.

(2) පූජනීය ස්ථානවල සඳකඩ පහණ දෙපස ඉදිකර ඇති නිසා ය.

(3) ලාංකීක කලා කරුවාගේ ප්‍රතිභා මහිමය පෙන්වන නිර්මාණයක් වන නිසා ය.

(4) පඩිපෙළ ඉදිරියට නෙරා ඒම වැළැක්වීමට ඉදි කර ඇති ආධාරකයක් නිසා ය.

12 මලක් හා කොළයක් නිර්මාණශීලීව ඒකකයක් ලෙස ගෙන කිසියම් රටාවකට අනුව පැතිරී යන අයුරින් යෙදීමෙන් නිර්මාණය වන්නේ,

(1) ව්‍යාප්ත මෝස්තරයකි. (2) සමමිතික මෝස්තරයකි.

(3) අවිධිමත් මෝස්තරයකි. (4) මුළුතල මෝස්තරයකි.

13 තිවංක පිළිමගෙය තුළ දක්නට ලැබෙන චිත්‍ර

(1) පොළොන්නරු යුගයේ පැවති චිත්‍ර කලාවේ ලක්ෂණ කියාපායි.

(2) දේව සංකල්පයට පමණක් මුල්තැන දෙමින් නිර්මාණය කර ඇත.

(3) පොළොන්නරු චිත්‍ර ශිල්පියා සතු කුසලතාව කියාපාන නිදසුනකි.

(4) සීගිරි සම්ප්‍රදායට හා මහනුවර සම්ප්‍රදායට නෑකම් කියන සිතුවම් සම්ප්‍රදායකි.

14 මූර්තියක් නෙළීමේදී සිදු කරනු ලබන්නේ,

(1) අවශ්‍ය කොටස් එකතු කරමින් අනවශ්‍ය කොටස් කපා ඉවත් කරමින් රූපය ගොඩනැගීමය.

(2) අච්චුවක් මඟින් පිටපතක් ලබා ගැනීමයි.

(3) අනවශ්‍ය කොටස් කපා ඉවත් කර රූපය මතු කිරීමයි.

(4) ඉවත ලන ද්‍රව්‍ය භාවිතා කර යම්කිසි රූපයක් මතු කිරීමයි.

15 නිශ්චල ද්‍රව්‍ය බලා ඇඳීමකදී භාවිතා කරන විෂය කරුණක් නොවන්නේ,

(1) පරිමාණය හා පරිමාව (2) නිර්මාණාත්මක හැඩතල

(3) මතුපිට ස්වභාවය (වයනය) (4) පර්යාවලෝකය

- **ප්‍රශ්න අංක 16 සිට 20තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වනසේ වාක්‍ය බැගින් ලියන්න.**

16 ලැඹකුන් ..............................................................................................................

..............................................................................................................

17 ඕදාත ..............................................................................................................

..............................................................................................................

18 කිරිහිඳවීම ..............................................................................................................

..............................................................................................................



19 ආයක ..............................................................................................................

..............................................................................................................

20 වයිති ..............................................................................................................

..............................................................................................................

- ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන්වලට ගැලපෙන රූපය **A, B, C, D, E** යන චිත්‍ර සටහන් අතුරින් තෝරා එයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය චිත්‍රය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| 21 |  | (..................) |  | A |
| 22 |  | (..................) |  | B |
| 23 |  | (..................) |  | C |
| 24 |  | (..................) |  | D |
| 25 |  | (..................) |  | E |

2

- ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය / වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

26 ඉන්දු නිම්නයෙන් හමු වූ ........................................................................................ නැමැති මුද්‍රාව ශිව දෙවියන්ගේ මූලාදර්ශයක් ලෙස සලකනු ලබයි.

27 ලක්දිව ගෘහ නිර්මාණ ශිල්පයේ සුවිශේෂ නිර්මාණයක් ලෙස සැලකෙන ........................................................ ධර්ම ශ්‍රවණය, දළදා පිදීම හා පිරිත් ශ්‍රවණය සඳහා ඉදිකල බව කියවේ.

28 ශිවගේ පතිනිය වූ නිසා ශිව ශක්ති, ශිව කාමසුන්දරී ආදී නාමයන්ගෙන්ද ........................................................ දෙවඟන හඳුන්වනු ලැබේ.

29 පිහිටි ගලෙහිම ස්වභාවය අනුව අධි උන්නත ශිල්ප ක්‍රමයට සම්පිණ්ඩනය කළ පිළිම ................................................................... දී දැකිය හැකිය.

30 වර්ෂ 1924 - 1996 කාලය තුළ ජීවත්ව සිටි .................................................................. ජනප්‍රිය දමිළ ජාතික කාටූන් චිත්‍ර ශිල්පියෙකි.

- **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**

|  |  |  |  |  |
|---|---|---|---|---|
| F | G | H | I | J |

31 F අක්ෂරයෙන් දැක්වෙන රූපයෙහි ඇති මූර්තිය නම් කරන්න. ..........................................................................

32 G අක්ෂරයෙන් දැක්වෙන සිතුවම හමු වූ ස්ථානය කුමක්ද? ..........................................................................

33 H අක්ෂරයෙන් දැක්වෙන සිතුවම නම් කරන්න. ..........................................................................

34 I අක්ෂරයෙන් දැක්වෙන පොත් පිටකවරයේ නම කුමක්ද? ..........................................................................

35 J අක්ෂරයෙන් දැක්වෙන ගොඩනැගිල්ලෙහි ගෘහ නිර්මාණ ශිල්පියා නම් කරන්න.

..........................................................................................................................................................

- **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා පහත කලා කෘතිය හඳුනාගෙන දී ඇති උප මාතෘකාවලට අදාළව අර්ථවත් වාක්‍ය 5 ක් ලියන්න.**



36 හඳුනාගත්බව ..........................................................................
..........................................................................

37 ශිල්පියා ..........................................................................
..........................................................................

38 වස්තු විෂය ..........................................................................
..........................................................................

39 සංරචනය ..........................................................................
..........................................................................

40 හැඟීම් ප්‍රකාශනය ..........................................................................
..........................................................................

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය

# චිත්‍ර කලාව - II

කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි.

- ★ ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ **පසු පිටේ** පැහැදිලි ව සටහන් කරන්න.
- ★ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ★ දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- ★ සියලුම ද්‍රව්‍ය ඇස්මට්ටමින් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දැන්වීමට ඔබට අවසර තිබේ.

---

### නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට, චිත්‍රය නිර්මාණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න.

★ **මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

★ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- **රේඛා අධ්‍යයනය**
  1. වෙනම කඩදාසියක රේඛා අධ්‍යයනය කරන්න.
- **වර්ණ චිත්‍රය**
  2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම.
  3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
  4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම.
  5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාව
  6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

**සැලකිය යුතුයි**

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලැල්ල ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ගත හැකිය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019


11 ශ්‍රේණිය

# චිත්‍ර කලාව - II

**ආදර්ශ ද්‍රව්‍ය ඇටවුම හා ශාලාධිපති උපදෙස්**

**සපයා ගත යුතු ද්‍රව්‍ය**

- සුදු කඩදාසියකින් ආවරණය කළ හිස් බිස්කට් පෙට්ටියක් (ආසන්න වශයෙන් 10" x 8" x 4")
- විචිත්‍ර වර්ණයෙන් යුතු පත්‍ර විශාල කොළ 05 ක් සහිත ක්‍රෝටන් අත්තක්.
- වර්ණවත් කොටු සහිත සර්වියට් එකක්.
- හතරැස් වීදුරු බෝතලයක් (කහ වර්ණය යෙදූ) ජලය දමා
- මධ්‍යම ප්‍රමාණයේ කොමඩු ගෙඩියක්
- ද්‍රව්‍ය තැබීමට සුදුසු ආධාරකයක්



සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය

# චිත්‍ර කලාව - III

කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති තීරුවේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීමට භාවිත කළ හැකිය. (ෆේල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
  ඇඳීමට සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ. (ජාතික මට්ටමේ විභාගයේදී පමණි.) (පළාත් මට්ටමේ තමන් විසින් සපයා ගත යුතුය.)

---

- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

### "අ" කොටස - චිත්‍ර සංරචනය

(01) ගමේ පන්සල අසළ මල් කඩය

(02) නගරයේ ජනාකීර්ණ වීදියක්

(03) තැතිගත් මුව රංචුවක්

(04) මහජන උද්ඝෝෂණයක්

### "ආ" කොටස - මෝස්තර නිර්මාණය

(05) ඔබ කැමති ස්වභාවික මලක් හා කොළයක් ඇසුරින් චීත්ත රෙද්දක් සඳහා සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් ඇඳ දක්වන්න.

(06) පාරම්පරික සත්ත්ව මෝස්තර යොදාගෙන කොඩියක් සැළසුම් කර වර්ණ ගන්වන්න.

(07) අඩි 8 x 6 ප්‍රමාණයේ ඇඳ ඇතිරිල්ලක් සඳහා මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.

### "ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

(08) ''මාර්ග නීති පිළිපදිමු'' මැයෙන් විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

(09) ''අමාගේ වීරකම්'' නැමැති ළමා පොත සඳහා පිටකවරයක් නිර්මාණය කරන්න.

(10) මව් සෙනෙහස පිළිබඳ ලියවුණු පද්‍ය පන්තියක් සඳහා සුදුසු වර්ණවත් සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.

## පිළිතුරු පත්‍රය - I පත්‍රය (ලිඛිත)

(01) තිස්ස රණසිංහ (02) ලෝකඩ (03) ස්වභාවිකවාදී (04) වියුක්තවාදී

(05) දුෂ්කර ක්‍රියාව (06) මිනාර් හෙවත් මිනරෙට් (07) ටෙම්පරා (08) ආනන්ද කුමාරස්වාමි

(09) තෙල්සායම් (10) ස්ටැන්ලි අබේසිංහ (11) 3 (12) 1

(13) 4 (14) 3 (15) 2

(16) මුහුදු සර්පයෙකු විසින් වෙලාගත් පියෙකු හා පුතුන් දෙදෙනෙකු මූර්තිමත් කර ඇති ග්‍රීක මූර්තියකි.

(17) අතීතයේදී සුදු වර්ණය සඳහා භාවිතා කළ නාමයයි. / ඕදාත යනුවෙන් හඳින්වෙන්නේ සුදු වර්ණයකි.

(18) දුමේ දමා හෝ අටුවේ දමා / මද අව්වේ වියලා ගැනීම.

(19) ආයක යනු වාහල්කඩ හඳුන්වන තවත් නාමයකි.

(20) බිතු සිතුවම්වල ආරක්ෂාව සඳහා මතුපිටින් ගාන ලද ආලේපනය වයිති නම් වේ.

(21) C (22) E (23) D (24) B

(25) A (26) පශුපති (27) නිශ්ශංකලතා මණ්ඩපය

(28) පාර්වතී (29) ගල් විහාරය / උත්තරාරාමය

(30) සී. ශිවඥානසුන්දරම් / සිරිත්තිරන් සුන්දර් (31) වැතිර ගත් කාන්තාව / වැතිර සිටින රුව.

(32) තීබ්ස්වල නොබාමුන් සොහොන් ගැබෙහි. (33) රජ මැදුරේ කාන්තාවෝ

(34) පාට්ටුත්තිරත්තාලේ (35) ස්ථපතිරායර්

(36) මෙම සිතුවම අවිඥොන්හි යුවතියෝ නම් වේ.

(37) ස්පාඤ්ඤ ජාතික පැබ්ලෝ පිකාසෝ විසින් අඳින ලදී.

(38) ස්පාඤ්ඤයේ බාර්සිලෝනා නගරයේ අවිග්නොන් නම් වීදියේ ජීවත් වූ වීදි ස්ත්‍රීන් / අභිසරුලියන්

(39) ස්ත්‍රී රූප 05 කින් ඝණික හැඩතල වලින් යුතුව සංරචනය කොට ඇත.

(40) ස්ත්‍රීන්ගේ බාහිර කායික සුන්දරත්වය වෙනුවට අභ්‍යන්තර හැඟීම් ගති ලක්ෂණ මතු කිරීමට ශිල්පියා උත්සාහ දරා ඇත. (ලකුණු $1 \times 40 = 40$)

## II පත්‍රය - ස්වාභාවිකත්ව අධ්‍යයනය හා ද්‍රව්‍ය සම්පිණ්ඩනය ලකුණු දීමේ නිර්නායක

| | | |
|---|---|---|
| (1) | රේඛා අධ්‍යයනය | - ලකුණු 05 |
| (2) | ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත්ව සංරචනය කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| (3) | ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| (4) | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාවලෝකය ත්‍රිමාණ ලක්ෂණ ඇස් මට්ටම අවකාශ භාවිතය) | - ලකුණු 05 |
| (5) | වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම | - ලකුණු 05 |
| (6) | චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ත නිමාව | - ලකුණු 05 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 30 |

III වන පත්‍රය සඳහා හිමි ලකුණු ලකුණු 30

### III පත්‍රය - "අ"කොටස - චිත්‍ර සංරචනය

**ලකුණු දීමේ නිර්ණායක**

(1) තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේදී ඊට උචිත වාතාවරණය හා ප්‍රකාශ කර ඇති අයුරු - ලකුණු 06

(2) මානව රූ හා සත්ව රූ ඇතුළු සියලු හැඩතල තල මත සම්පිණ්ඩනය කර ඇති අයුරු - ලකුණු 06

(3) සිද්ධාන්ත භාවිතය - ලකුණු 06

(4) වර්ණ භාවිතයේ කුසලතා - ලකුණු 06

(5) අනුමත ශෛලියට අනුව චිත්‍රයේ සමස්ත නිමාව - ලකුණු 06

**මුළු ලකුණු - ලකුණු 30**

### III පත්‍රය "ආ"කොටස - මෝස්තර හා සැරසිලි නිර්මාණය

**ලකුණු දීමේ නිර්ණායක**

(1) මාතෘකාවට හා කාර්යයට උචිත අයුරින් නවතාවයකින් යුතුව සැලසුම් කිරීම - ලකුණු 06

(2) පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැලපෙන බව - ලකුණු 06

(3) නිර්මාණාත්මක බව හා හැඩතල සම්පිණ්ඩනය කිරීමේ හැකියාව - ලකුණු 06

(4) උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීමේ හැකියාව - ලකුණු 06

(5) විචිත්‍රත්වය, චමත්කාරජනක බව, සමස්ත නිමාව - ලකුණු 06

**මුළු ලකුණු - ලකුණු 30**

### III පත්‍රය "ඉ"කොටස - ග්‍රැෆික් චිත්‍ර

**ලකුණු දීමේ නිර්ණායක**

(1) මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් සැලසුම් කිරීම. - ලකුණු 06

(2) වාණිජමය හා කර්මාන්තයට උචිත අයුරින් සැලසුම් කිරීම. - ලකුණු 06

(3) රේඛා හා හැඩතල හා සැරසිලි අර්ථවත්ව භාවිත කිරීමේ හැකියාව - ලකුණු 06

(4) උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීම. - ලකුණු 06

(5) විචිත්‍රත්වය, චමත්කාරය හා සමස්ත නිමාව - ලකුණු 06

**මුළු ලකුණු - ලකුණු 30**

| | | | | |
|---|---|---|---|---|
| **(i)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 40 |
| **(ii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| **(iii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| | | මුළු ලකුණු | = | 100 |